# සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
## கலாசார அலுவல்கள் திணைக்களம்
## Department of Cultural Affairs

8 වෙනි මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල 8 ஆம் மாடி, செத்சிறிபாய, பத்தரமுல்லை 8th floor, Sethsiripaya, Battaramulla

සොඳුරු දේශයක පෙරගමන්කරු வளமான தேசமொன்றின் முன்னோடி *Trailblazer of a Beautiful Nation*


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. — DCA/06/05/01/01 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date — 2026.07. 24 |

සිවුණු, හැදුණු, පිරුණු, සොඳුරු මිනිසුන් සපිරි පින්බර දේශයක් එක්ව ගොඩනගමු

அமைதியான, ஒழுக்கமான, முழுமையான சிறந்த மனிதர்களுடன் கூடிய புனித தேசத்தை ஒன்று சேர்ந்து கட்டியெழுப்புவோம்

Towards building a blessed nation of compassionate, complete and culturally rich human beings

**අභ්‍යන්තර චක්‍රලේඛ අංක : 12/2026**

දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

............................................

## 41වන කලාභූෂණ රාජ්‍ය සම්මාන උලෙළ - 2026

ශ්‍රී ලාංකේය ජ්‍යෙෂ්ඨ කලාකරුවන් ඇගයීමට ලක් කරමින් ඔවුනට රාජ්‍ය සම්මානයෙන් උපහාර දැක්වීම උදෙසා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වාර්ෂිකව සංවිධානය කරනු ලබන කලාභූෂණ රාජ්‍ය සම්මාන උලෙළ 2026 වසරේද පැවැත්වීමට කටයුතු සූදානම් කරමින් පවතී. කලාභූෂණ සම්මානලාභීන් තෝරාගැනීමේ ක්‍රියාවලිය පහත පරිදි වේ.

1. 2026 වර්ෂයට අවශ්‍ය කලාභූෂණ අයදුම්පත් පෞද්ගලිකව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත සෘජුව කැඳවීම් සිදු කරනු නොලැබේ.
2. සම්මානලාභීන් තේරීමේ බලය දිස්ත්‍රික් ලේකම් ඇතුලු විනිශ්චය මණ්ඩලයක් හරහා සිදුකිරීමට බලය පවරනු ලැබේ.
3. එක් එක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත තෝරාගත යුතු සම්මානලාභීන් සංඛ්‍යාව ඇමුණුම 01හි සඳහන් පරිදි නම් කරනු ලබයි.
4. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිටින සංස්කෘතික විෂය භාර නිලධාරී විසින් තම බලප්‍රදේශය තුළ සිටින කලාභූෂණ සම්මාන යෙන් පිදුම් ලැබීමට ඉතාමත් සුදුසු කලාකරුවන් වෙත ගොස් ඔවුන්ගේ තොරතුරු තමා විසින්ම රැස් කරගත යුතු වේ (මීට පෙර කලාභූෂණ සම්මාන ලබා නොගත් අයකු විය යුතුය).

   සංස්කෘතික විෂය භාර නිලධාරී විසින් තොරතුරු ලබා නොගත් කලාකරුවන්ට ද අවස්ථාවක් ලබාදීම සඳහා කලාභූෂණ සම්මානය සඳහා අයදුම් කිරීමට ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් පළකරනු ලබන අතර, ඒ මගින් ද කලාභූෂණ සම්මානයෙන් පිදුම් ලැබීමට ඉතාමත් සුදුසු කලාකරුවන්ට අයදුම් කළ හැකි අතර, කලාභූෂණ සම්මානය සඳහා අයදුම්පතේ සඳහන් කර ඇති පරිදි ප්‍රවීණ කලාකරුවකු බව සනාථ කර ගැනීම සඳහා ඔවුන් සතුව ඇති සම්මාන සහතිකවල පිටපත් ලබාගෙන මෙම තොරතුරු අයදුම්පතට අමුණා කලාකරු විසින් අයදුම්පත්‍ර ප්‍රාදේශීය ලේකම් මගින් දිස්ත්‍රික් ලේකම් වෙත යොමු කළ යුතුය (ප්‍රාදේශීය සංස්කෘතික බලමණ්ඩලයේ නිර්දේශ කිරීම නොමැතිව වුව ද අයදුම්පත්‍ර ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කළ හැකිය).




අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director 2872035 | කාර්යාලය / அலுவலகம் / Office 2872031 2866731 | ෆැක්ස් / தொ.நகல் / Fax 2866732 | ඊ-මේල් / மின்னஞ்சல் / E-mail dcanews@sltnet.lk | වෙබ් ලිපිනය / இணையத்தளம் / Web Site www.culturaldept.gov.lk

5. එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් තෝරාගත් සම්මානලාභීන්ගේ හා ප්‍රාදේශීය ලේකම් වෙත සෘජුව ම ලබාදුන් කලාකරුවන්ගේ අයදුම්පත් හා සියලු තොරතුරු දිස්ත්‍රික් සංස්කෘතික නිලධාරී විසින් රැස් කර ගත යුතු වේ. එම රැස් කරගත් තොරතුරු දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පත් කරනු ලබන නව දෙනෙකුගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයකට ඉදිරිපත් කළ යුතු අතර, එම විනිශ්චය මණ්ඩලය සඳහා පහත නම්කර ඇති නිලධාරීන් පත්කර ගත යුතුය.

- දිස්ත්‍රික් ලේකම් හෝ බලය පවරන ලද වෙනත් මාණ්ඩලික නිලධාරියෙක්
- පළාත් සභාවෙහි පළාත් සංස්කෘතික අමාත්‍යාංශ ලේකම් හෝ නම් කරන ලද වෙනත් නිලධාරියෙක්
- දිස්ත්‍රික් සංස්කෘතික නිලධාරී
- දිස්ත්‍රික් සංස්කෘතික බල මණ්ඩලයේ සභාපති
- ජන අනුපාතය අනුව වැඩිම ජනගහණයක් ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල පහක (05) සංස්කෘතික නිලධාරීන් පස්දෙනෙක්
- සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු නිරීක්ෂණ නිලධාරියකු ලෙස සහභාගිවනු ඇත

6. විනිශ්චය මණ්ඩලය පිළිබඳව යම්කිසි සංශෝධනයක් අවශ්‍ය වේ නම් සංස්කෘතික අධ්‍යක්ෂගේ අනුමැතිය ලබාගත යුතුවේ.

7. එම විනිශ්චය මණ්ඩලය විසින් තම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී ඇති සම්මානලාභීන් සංඛ්‍යාව තෝරා ඇමුණුම් 05 හි සඳහන් ආකෘති පත්‍රය මගින් 2026.09.30 දිනට පෙර සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත ලැබීමට සැළැස්විය යුතු වේ. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී ඇති සම්මානලාභීන් සංඛ්‍යාව ඉක්මවා තෝරා එවා තිබුණහොත් ලේඛනයේ සඳහන් සම්මානලාභීන්ගෙන් අංක 01 සිට පහළට නම් කළ ප්‍රමාණය ලබාගෙන ඉතිරි ප්‍රමාණය නොසලකා හරිනු ලැබේ. මුද්‍රණ දෝෂයකින් හෝ වැඩිපුර නම් සඳහන් නොකිරීමට වග බලා ගත යුතුය. එවැනි තත්ත්වයන් මත සුදුසු කලාකරුවන් හට අසාධාරණයක් සිදුවිය හැකි බැවින් නම් කළ ප්‍රමාණය පමණක් තෝරා එවීමට කටයුතු කරන මෙන් කාරුණිකව සඳහන් කරමි.

සම්මානලාභීන් තෝරා ගැනීමට අවශ්‍ය තොරතුරු රැස්කර ගැනීම සඳහා මේ සමඟ අමුණා ඇති ඇමුණුම් 02 ආකෘතිය භාවිතා කරමින් කටයුතු කළ යුතුය. තවද, ඇමුණුම 03 හි ආකෘතිය භාවිතා කරමින් කලාකරුවාගේ කලා ජීවිතය පිළිබඳ තොරතුරු පැහැදිළිව සඳහන් කර, පත්‍රිකාව ඔබ විසින් නිසි පරිදි සකස් කර, එහි මුද්‍රිත පිටපත, කලාකරුවාගේ පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූප තුනක් (03)ක් ද සමඟ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුයි. එහි මෘදු පිටපත ardcultural@gmail.com යන විද්‍යුත් ලිපිනය වෙත එවිය යුතු බව ද සළකන්න (font – fm abhaya, font size – 12).

8. කලාකරුවා වෙත පිරිනමනු ලබන ත්‍යාග මුදල වෙනුවෙන් ලබා දෙන චෙක්පත නිවැරදිව ලිවීම සඳහා කලාකරුවාගේ සක්‍රීය බැංකු ගිණුමක පාස් පොතෙහි ගිණුම් හිමියාගේ තොරතුරු ඇතුළත් පිටුවේ ඡායා පිටපතක් අනිවාර්යයෙන් ම එවිය යුතුය.

9. මෙම සම්මානලාභීන් තේරීමේ සම්පූර්ණ බලය දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත පැවරෙන අතර, යම්කිසි සාවද්‍ය තොරතුරක් ලබා දී තිබුණහොත් අදාළ කමිටුව විසින් ඊට වගකිව යුතුය.

10. කිසියම් කලාකරුවෙක් සිදුකරන ජාතික මෙහෙවර දැඩි ලෙස අධ්‍යයනය කිරීමෙන් පසුව සම්මානය හිමිවිය යුතු "කලාකරුවා" තීරණය කළ යුතු අතර, කලාකරුවන් පහත පරිදි අර්ථ ගන්වා ඇත.

*වේදිකා නාට්‍ය ශිල්පීන් හා රංගන ශිල්පීන්, ලේඛකයන්, චිත්‍ර හා මූර්ති ශිල්පීන්, කැටයම් ශිල්පීන්, ලාක්ෂා වියමන් ශිල්පීන්, රුකඩ ශිල්පීන්, නර්තන ශිල්පීන්, බෙර වාදකයන්, සංගීතඥයින්, කවියන්, ගායක ගායිකාවන්, චිත්‍රපට හා ටෙලිනාට්‍යකරුවන්, බයිලා වාදකයින්, අංගම්පොර ශිල්පීන්, මැජික් හා වෙනත් ජන කලා ශිල්පීන් මෙම රාජ්‍ය සම්මාන සඳහා සුදුසුකම් ලබයි. තවද, වෘත්තීමය වශයෙන් හෝ පාරම්පරික වශයෙන් එම ක්ෂේත්‍රයේ*

*නියුතු කලාකරුවන් ගැන විශේෂයෙන් සළකා බලා සහතික ඉදිරිපත් කළ නොහැකි, එහෙත් පසුගිය වසර 10 ක කාලයක් හෝ ඊට පෙර කලාවට විශිෂ්ට සේවයක් ඉටු කළ කලාකරුවන් සම්බන්ධව සොයා බලා ඔවුන් ඉදිරිපත් කරන තොරතුරු පිළිගත හැකි මට්ටමක පවතින්නේ නම් තෝරා ගත හැකි වේ.*

*රජයේ රැකියාවක නිරත වන නිලධාරියෙකු එම රැකියාවට අදාළව යම් කලා කටයුත්තක නිරත වූයේ නම් එය මෙම සම්මානය සඳහා ලකුණු ලබාදීමේදී ඇගැයීමට ලක් කරනු නොලැබේ. නමුත් තම රැකියාවට පරිබාහිරව සිදු කර ඇති කලා කටයුතු ඇගයීමට ලක් කෙරෙන අතර ලකුණු ලබාදීමේදී සලකා බලනු ලැබේ*

- **කලාකරුවන් තෝරා ගැනීමේදී සැලකිල්ලට භාජනය කළ යුතු නිර්ණායක :**

i. වයස් කාණ්ඩය : අනිවාර්යයෙන්ම 2026.06.30 දිනට වයස අවුරුදු 60 ඉක්මවා සිටිය යුතුය

ii. ක්ෂේත්‍රයේ කලාකරුවකු ලෙස කටයුතු කළ කාලය වසර 15කට වඩා වැඩි විය යුතුය

iii. නිර්මාණ සිදු කරන ලද කලා ක්ෂේත්‍රය

iv. පරම්පරාගත ශිල්පියෙකු වීම/ ප්‍රවීණ කලාකරුවකු වීම

v. ලබා ඇති ජයග්‍රහණ : ජාත්‍යන්තර/ ජාතික/ පළාත්/ දිස්ත්‍රික්/ ප්‍රාදේශීය (ඉදිරිපත් කරන ලද ජයග්‍රහණ සියල්ල කලා ක්ෂේත්‍රයට අදාළ ඒවා ද යන්න සැහීමකට පත් විය යුතුය)

vi. ලබාගත් ඇගයීම් හෝ ගරු සම්මාන (ලබා ඇති ඇගයීම් හෝ සම්මාන සියල්ල කලා ක්ෂේත්‍රයට අදාළ ඒවා ද යන්න සැහීමකට පත් විය යුතුය)

vii. සිදු කළ හෝ ජනගත කළ නිර්මාණකරණයන් සංඛ්‍යාව

viii. සංස්කෘතික බලමණ්ඩල සාමාජිකත්වය

ix. සමාජ සේවා කටයුතු

<u>සැ.යු.</u> : *කලාකරු වෙත ගොස් ඔහුගේ තොරතුරු ලබා ගන්නා අවස්ථාවේදී ඉදිරිපත් කරන ලද තොරතුරු ඉහත නිර්ණායකයන් පදනම් කරගෙන සිදු කළ යුතු අතර, ඉදිරිපත් කරන ලද සෑම ලියවිල්ලක් ම කලා ක්ෂේත්‍රයට අදාළ ඒවා බවට සහතික විය යුතුය. තවද ලකුණු ලබාදීමේ ලේඛනය සමඟ තෝරාගත් කලාකරුවන්ට අදාළව ඇමුණුම 02 යටතේ වූ කලාකරුවගේ තොරතුරු ලබා ගැනීමේ පත්‍රිකාව ද සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු බව සළකන්න.*

11. යම්කිසි කලාකරුවෙක් සම්මාන ලබාදීම නිර්දේශ වී රාජ්‍ය සම්මාන උලෙළ පැවැත්වීමට පෙර මියගියහොත් ඒ පිළිබඳව නොපමාව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව දැනුවත් කර, ඒ වෙනුවට දිස්ත්‍රික් තේරීම් කමිටුව විසින් නිර්දේශිත වාර්තාවෙහි ඊළඟ වැඩිම ලකුණු ලබා ඇති කලාකරු නම්කර සංස්කෘතික අධ්‍යක්ෂ වෙත දන්වා එවීමට කටයුතු කළ යුතුය. එම සංශෝධනය පිළිබඳව අදාළ ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර දිස්ත්‍රික් ලේකම් මඟින් එවීමට දිස්ත්‍රික් සංස්කෘතික නිලධාරී කටයුතු කළ යුතුය.

12. නිර්දේශිත නාමයන් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත එවීමෙන් පසු අදාළ සම්මානලාභීන් වෙත ඒ පිළිබඳව දැනුම් දීම සහ ඉදිරි කටයුතු සංස්කෘතික දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබන අතර, දිස්ත්‍රික් කමිටුව විසින් ලබාගත් තීරණ රහස්‍ය වාර්තාවක් ලෙස සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු බව ද සළකන්න.

13. සම්මානලාභීන් තේරීමේ දී ඔවුනගේ සුදුසුකම් පරීක්ෂා කිරීමට ඇමුණුම හතර (04) හි සඳහන් පරිදි නිර්ණායකයන් දක්වා ඇත. තව ද, විනිශ්චය මණ්ඩලයේ අවසාන තීරණය අනුව තෝරාගත් සම්මානලාභීන්ගේ ලේඛනය ඇමුණුම පහ (05) පරිදි සකස් කර විනිශ්චය මණ්ඩලයේ සියලු දෙනා ම අත්සන් කර නිලමුද්‍රාව තබා රහස්‍ය ලේඛනයක් සේ දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු බව ද සළකන්න (සම්මානලාභීන් ලබාදෙන කෘති හෝ ඇගයීම් සහතික පිටපත් ආපසු ලබා දෙනු නොලැබේ).

14. එසේම, සමස්ත දිවයින ම ආවරණය වන පරිදි දිස්ත්‍රික්ක 25න් කලාභූෂණ සම්මානලාභීන් 200ක් විනිශ්චය මණ්ඩලවලින් තෝරා ගනු ලැබේ.

15. එක් එක් දිස්ත්‍රික්ක සඳහා තෝරා ගන්නා කලාභූෂණ සම්මානලාභීන් උත්සවයට සහභාගි වී සම්මාන ලබා ගන්නා තෙක් සිදු වන කාර්යයන් හා උත්සවයට සහභාගි කරවීමේ වගකීම ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි සංස්කෘතික විෂය භාර නිලධාරීන්ගේ වගකීම වන අතර, ඔවුන් සහභාගි නොවීමෙන් යම් අපහසුතාවයක් සිදුවුවහොත් එහි වගකීම ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංස්කෘතික විෂය භාර නිලධාරීන් සතු වන බව වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි.

16. ඒ ඒ දිස්ත්‍රික්කයන්හි සම්මානලාභීන් තේරීම පිළිබඳව අවසන් තීරණය දිස්ත්‍රික් ලේකම් සතුවේ.



**කේ.එස්. දිල්හානි**
සංස්කෘතික අධ්‍යක්ෂ

**කලාභූෂණ සම්මාන උලෙළ 2026**
**ඇතුළත් ලිපි ලේඛන**

1. චක්‍රලේඛය
2. ඇමුණුම - 01 එක් එක් දිස්ත්‍රික්කයට අදාළ සම්මාන ප්‍රමාණය
3. ඇමුණුම - 02 තොරතුරු ලබා ගැනීමේ අයදුම්පත
4. ඇමුණුම - 03 කලාකරුගේ තොරතුරු ලබා ගැනීම
5. ඇමුණුම 03 (i). කලාකරුගේ කලා ජීවිතය පිළිබඳ තොරතුරු
6. ඇමුණුම - 04 සැළකිල්ලට භාජනය කළ යුතු කරුණු
7. ඇමුණුම - 05 තෝරාගත් කලාකරුවන්ගේ ලේඛනය
8. ඇමුණුම - 06 කලාභූෂණ සම්මානලාභීන් තෝරා ගැනීමේදී සැළකිල්ලට භාජනය කළ යුතු නිර්ණායක සඳහා ලකුණු ලබාදිය යුතු ආකාරය

ඇමුණුම - 01

**2026 කලාභූෂණ රාජ්‍ය සම්මානය සඳහා සම්මානලාභීන් තෝරා ගැනීම**
**ප්‍රාදේශීය ලේකම් කාර්යාල ලේඛනය**
**ප්‍රාදේශීය සම්මාන සංඛ්‍යාව - 200**

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගණන | සම්මාන සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | කොළඹ | 13 | 15 |
| 02 | ගම්පහ | 13 | 15 |
| 03 | කළුතර | 14 | 11 |
| 04 | ගාල්ල | 22 | 15 |
| 05 | මාතර | 16 | 10 |
| 06 | හම්බන්තොට | 12 | 06 |
| 07 | මහනුවර | 20 | 12 |
| 08 | මාතලේ | 11 | 05 |
| 09 | නුවරඑළිය | 10 | 03 |
| 10 | අනුරාධපුර | 22 | 11 |
| 11 | පොළොන්නරුව | 07 | 04 |
| 12 | කුරුණෑගල | 30 | 20 |
| 13 | පුත්තලම | 16 | 08 |
| 14 | බදුල්ල | 15 | 07 |
| 15 | මොනරාගල | 11 | 05 |
| 16 | රත්නපුර | 18 | 09 |
| 17 | කෑගල්ල | 11 | 05 |
| 18 | ත්‍රිකුණාමළය | 12 | 06 |
| 19 | මඩකළපුව | 14 | 06 |
| 20 | අම්පාර | 20 | 09 |
| 21 | යාපනය | 15 | 08 |
| 22 | මන්නාරම | 05 | 03 |
| 23 | වව්නියාව | 04 | 02 |
| 24 | මුලතිව් | 06 | 03 |
| 25 | කිළිනොච්චි | 04 | 02 |

රාජ්‍ය කලාභූෂණ සම්මාන උලෙළ - 2026

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

ඡායාරූපයක් අලවන්න

**" කලාභූෂණ " සම්මාන සඳහා කලාකරුවාගේ තොරතුරු ලබා ගැනීම.**

1. පදිංචි දිස්ත්‍රික්කය:

2. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :

3. 2026.06.30 දිනට වයස : අවු:...................... මාස:

4. ප්‍රධාන කලා මාධ්‍යය :

5. කලාකරුවාගේ මුලකුරු සමඟ නම :..............................................................................

6. මුලකුරු වලින් හැඳින්වෙන නම්..............................................................................

..............................................................................

7. කලා ජීවිතයේ භාවිත වන වෙනත් නම් :..............................................................................

8. බැංකු ගිණුමේ සඳහන් නම :..............................................................................

*(බැංකු ගිණුමේ සඳහන් පරිදිම ඉංග්‍රීසියෙන් සඳහන් කළ යුතු අතර, බැංකු පාස් පොතෙහි තොරතුරු සඳහන් පිටුවේ පිටපතක් අමුණා එවන්න)*

9. ස්ථිර පදිංචි ලිපිනය :..............................................................................

..............................................................................

10. 1. කලාකරුවාගේ දුරකථන අංකය :..............................................................................

11.සමීපතම ඥාතියකුගේ දුරකථන අංකය :..............................................................................

11. ඉගෙනුම ලැබූ පාසල් හා වෙනත් අධ්‍යාපනික තොරතුරු :..............................................................................

..............................................................................

..............................................................................

12. උපත ලැබූ ගම් ප්‍රදේශය :..............................................................................

13. උපන් දිනය :..............................................................................

14. පාරම්පරික කලා ශිල්පියෙකු නම් පරම්පරාව පිළිබඳ කෙටි විස්තරය :

14.1. දැනටමත් තම පාරම්පරික කලාවට සක්‍රීය දායකත්වයක් දක්වනවාද යන වග :

........................................................................................................

14.2. ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරා ගොඩනගා තිබේද?........................................................

15. පාරම්පරික කලාකරුවකු නොවන්නේ නම් කලා මෙහෙවර පිළිබඳ කෙටි විස්තරය :

........................................................................................................

........................................................................................................

16. ලබාගෙන ඇති රාජ්‍ය සම්මාන පිළිබඳ තොරතුරු :

........................................................................................................

........................................................................................................

........................................................................................................

17. රාජ්‍ය නොවන සම්මාන පිළිබඳ තොරතුරු :........................................................

........................................................................................................

18. ලබාගත් ජයග්‍රහන පිළිබඳ තොරතුරු :...........................................................

........................................................................................................

........................................................................................................

19. සෞන්දර්ය විෂයන් පිළිබඳ ග්‍රන්ථ රචනා කර මුද්‍රණය කර තිබේ නම් ඒ පිළිබඳ විස්තර :

........................................................................................................

........................................................................................................

20. රඟ දැක්වීම් / සංදර්ශන ආදිය සංවිධානය කර ඇත්නම් එහි විස්තර :

........................................................................................................

........................................................................................................

21. වේදිකා නාට්‍ය/ටෙලි නාට්‍ය/චිත්‍රපට/වාර්තා චිත්‍රපට ආදිය නිෂ්පාදනය කර ඇත්නම් එම නිර්මාණවල නම්:........................................................................................

........................................................................................................

22. වෙනත් අයගේ නිර්මාණ සඳහා දායක වූයේ නම් ඒ පිළිබඳ විස්තර :

.............................................................................................................................

.............................................................................................................................

23. කලා ක්ෂේත්‍රයට දරුවන්ගේ ඇති සබඳතා :..........................................................................

.............................................................................................................................

24. කලාකරුවාගේ සාමාන්‍ය සෞඛ්‍ය තත්ත්වය :..........................................................................

.............................................................................................................................

25. කලාකරුවාට රජයෙන් ලැබෙන ආධාර :..........................................................................

.............................................................................................................................

26. කලාකරුගේ කලා ජීවිතය පිළිබඳ තොරතුරු

*මේ සමඟ අමුණා ඇති ඇමුණම 03 පත්‍රිකාවේ සඳහන් පරිදි ඇමුණුම 03හි (i) සම්පූර්ණ කරන්න:*

27. ප්‍රාදේශීය සංස්කෘතික බලමණ්ඩලයේ නිර්දේශ කිරීම :

අයදුම්පත පරීක්ෂා කළෙමි. රාජ්‍ය කලාභූෂණ සම්මානය පිරිනැමීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බව නිරීක්ෂණය විය. අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

..........................................

සභාපති/ලේකම්

28. සංස්කෘතික විෂය භාර නිලධාරීගේ වාර්තාව.

2026 වර්ෂය සඳහා කලාභූෂණ සම්මාන පිරිනැමීම පිණිස ........................................................ මහතා/මහත්මිය/මෙනවිය සුදුසු කලාකරුවකු බව නිර්දේශ කරමි. එම කලාකරුවා මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පදිංචිකරුවෙක් බව සහතික කරමි. මෙම කලාකරුවා/කලාකාරිණිය මීට පෙර කලාභූෂණ සම්මානය ලබාගෙන නොමැති බැව් තහවුරු කරමි.

දුරකථන අංකය : ..................................

දිනය : ................................................ ......................................................

සංස්කෘතික විෂය භාර නිලධාරී

නම :

අත්සන :

**29.** ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය :

2026 වර්ෂය සඳහා කලාභූෂණ සම්මානය පිරිනැමීම සඳහා මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පදිංචි ............................................................ මයා/මිය/මෙනවිය තෝරා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අයෙකු බවට සහතික කරමි.

දිනය: ................................ ..............................................

ප්‍රාදේශීය ලේකම්
නිල මුද්‍රාව

**30.** දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශය :

මාගේ දිස්ත්‍රික් බල ප්‍රදේශය තුළ පිහිටි...................................................... දරණ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පදිංචි ....................................................................... වන අය කලාභූෂණ සම්මානලාභියකු ලෙස නම් කිරීමට දිස්ත්‍රික් තේරීම් කමිටුව විසින් නිර්දේශ කර ඇති බැව් සහතික කරමි.

දිනය: ................................ ..............................................

දිස්ත්‍රික් ලේකම්
නිල මුද්‍රාව

**31.** සංස්කෘතික අධ්‍යක්ෂගේ අනුමැතිය.

මෙහි නම සඳහන් කලාකරුට කලාභූෂණ සම්මාන පිරිනැමීම සඳහා අවශ්‍ය පියවර ගැනීම අනුමත කරමි.

දිනය:.................................................. .................................................

කේ.එස්. දිල්හානි
සංස්කෘතික අධ්‍යක්ෂ

<u>සැ.යු.:</u>

*මෙහි සඳහන් කරුණු සම්පූර්ණ කර ගැනීමේදී සංස්කෘතික නිලධාරි/ සංස්කෘතික සංවර්ධන සහකාර/ සංවර්ධන නිලධාරි යන අයෙකු සම්මානලාභීන් වෙත ගොස් තමා විසින්ම මෙය සම්පූර්ණ කිරීමට වග බලා ගත යුතුය. තවද මෙම තොරතුරු සනාථ කර ගැනීම සඳහා ඔවුන් සතුව ඇති සම්මාන සහතිකවල පිටපත් ලබාගෙන මෙම තොරතුරු ලේඛනයට අමුණා එවිය යුතුය.*

<u>සම්මානලාභී තොරතුරු පත්‍රිකාව</u>

1. පළමු ඡේදය
   ඇතුළත් වියයුතු කරුණු
   - i. උපන් දිස්ත්‍රික්කය, ගම, පළාත
   - ii. ඉගෙනුම ලැබූ පාසල් හා අධ්‍යාපනය පිළිබඳ විස්තර
   - iii. සේවය කළ ස්ථාන ඇත්නම් ඒ පිළිබඳ විස්තර

2. දෙවන ඡේදය : කලා කටයුතු පිළිබඳ විස්තර

3. තුන්වන ඡේදය : ලබා ඇති සම්මාන ගෞරව සම්මාන ආදී විස්තර සහිතව නිවසේ අය කලාවට සම්බන්ධ වී ඇත්නම් ඒ පිළිබඳ විස්තර

   ඇතුළත්ව **A4** ප්‍රමාණයේ කොළයක සම්පූර්ණ ලියූ විස්තරයක්

   මේ සමඟ අමුණා ඇති ඇමුණුම 03 හි සඳහන් කර එවන්න.

4. හතරවන ඡේදය : කලාකරුවාගේ පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූප තුනක් (03)

   ලබාගෙන එකක් අයදුම්පතට අලවා ඉතිරි දෙක (02) තොරතුරු පත්‍රිකාව සමඟ එවන්න.

*ඇමුණුම 03* **(ii)**

කලාකරුගේ කලා ජීවිතය පිළිබඳ තොරතුරු

1.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

2.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

3.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.........................................

සංස්කෘතික විෂය භාර නිලධාරි

*සටහන:* *සමරු කලාපය සකස් කිරීමට මෙහි සඳහන් කරන විස්තර ඉතා වැදගත් බැවින්, නිසි පරිදි පැහැදිලිව සම්පූර්ණ කර එවන්න.*

*ඇමුණුම 04*

<u>කලාභූෂණ රාජ්‍ය සම්මාන උලෙළ - 2026</u>

<u>කලාකරුවන් තෝරා ගැනීමේදී සැලකිල්ලට භාජනය කළ යුතු නිර්ණායක :</u>

01. වයස් කාණ්ඩය : ( අවුරුදු 60 ඉක්මවා සිටිය යුතුය)..................................................

02. ක්ෂේත්‍රයේ කලාකරුවකු ලෙස කටයුතු කළ කාලය:..................................................

03. නිර්මාණ සිදු කරන ලද කලා ක්ෂේත්‍රය:..................................................

04. පරම්පරාගත ශිල්පියෙකු වීම/ ප්‍රවීණ කලා ශිල්පියෙකු වීම :..................................................

..................................................................................................................

05. ලබා ඇති ජයග්‍රහණ : ජාත්‍යන්තර/ජාතික/පළාත්/දිස්ත්‍රික්/ප්‍රාදේශීය ..................................

*(ඉදිරිපත් කරන ලද ජයග්‍රහණ සියල්ල කලා ක්ෂේත්‍රයට අදලා ඒවාද යන්න සෑහිමකට පත් විය යුතුය)*

06. ලබාගත් ඇගයීම් හෝ ගරු සම්මාන : ..................................................

..................................................................................................................

*(ලබා ඇති ඇගයීම් හෝ සම්මාන සියල්ල කලා ක්ෂේත්‍රයට අදාළ ඒවාද යන්න සෑහීමකට පත් විය යුතුය)*

07. සිදු කළ හෝ ජනගත කළ නිර්මාණකරණයන් සංඛ්‍යාව ..................................................

08. සංස්කෘතික බලමණ්ඩල සාමාජිකත්වය : ..................................................

09. සමාජ සේවා කටයුතු :..................................................

<u>සැ.යු.</u> : කලාකරු වෙත ගොස් ඔහුගේ තොරතුරු ලබා ගන්නා අවස්ථාවේදී ඉදිරිපත් කරන ලද තොරතුරු ඉහත නිර්ණායකයන් පදනම් කරගෙන සිදු කළ යුතු අතර, ඉදිරිපත් කරන ලද සෑම ලියවිල්ලක්ම කලා ක්ෂේත්‍රයට අදාළ ඒවා බවට සහතික විය යුතුය. තවද ලකුණු ලබාදීමේ ලේඛනය සමඟ තෝරාගත් කලාකරුවන්ට අදාළව ඇමුණුම 02 යටතේ වූ කලාකරුවගේ තොරතුරු ලබා ගැනීමේ පත්‍රිකාවද සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු බව සලකන්න.

ඇමුණුම 05

**සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**
**කලාභූෂණ රාජ්‍ය සම්මාන උලෙළ -2026**
**දිස්ත්‍රික්කයේ තෝරාගත් කලාභූෂණ සම්මානලාභීන්ගේ නාම ලේඛනය**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විනිශ්චය මණ්ඩලය විසින් තෝරා ගන්නා ලද සම්මානලාභීන් සංඛ්‍යාව පහත සඳහන් කර, සහභාගි වූ විනිශ්චය මණ්ඩලයේ අත්සන් යොදා ඔවුන්ගේ නිල මුද්‍රාව ඇත්නම් එයද අත්සනට යටින් තබා රහසිගතව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත එවීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

| අනු අංකය | තෝරාගත් සම්මානලාභියාගේ නම | කලා මාධ්‍යය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

විනිශ්චය මණ්ඩලය

1) සභාපති : නම :........................................................................
තනතුර :........................................................................
අත්සන :........................................................................
නිල මුද්‍රාව :

2) සාමාජික: නම :........................................................................
තනතුර :........................................................................
අත්සන :........................................................................
නිල මුද්‍රාව :

3) සාමාජික : නම :........................................................................
තනතුර :........................................................................
අත්සන :........................................................................
නිල මුද්‍රාව :

4) සාමාජික : නම :........................................................................
තනතුර :........................................................................
අත්සන :........................................................................
නිල මුද්‍රාව :

5) සාමාජික: නම :........................................................................
තනතුර :........................................................................
අත්සන :........................................................................
නිල මුද්‍රාව :

6) සාමාජික: නම :........................................................................
තනතුර :........................................................................
අත්සන :........................................................................
නිලමුද්‍රාව :

7) සාමාජික: නම :........................................................................
තනතුර :........................................................................
අත්සන :........................................................................
නිලමුද්‍රාව :

8) සාමාජික : නම :........................................................................
තනතුර :........................................................................
අත්සන :........................................................................
නිලමුද්‍රාව :

9) සාමාජික : නම :........................................................................
තනතුර :........................................................................
අත්සන :........................................................................
නිලමුද්‍රාව :

*ඇමුණුම 06*

**කලාභූෂණ රාජ්‍ය සම්මාන උලෙළ - 2026**

**කලාකරුවන් තෝරා ගැනීමේදී සැලකිල්ලට භාජනය කළ යුතු නිර්ණායක සඳහා ලකුණු ලබාදිය යුතු ආකාරය**

**මුළු ලකුණු ප්‍රමාණය 300**

1. වයස් කාණ්ඩය : ( අවුරුදු 60 ඉක්මවා සිටිය යුතුය) ලකුණු 40

   (60-64 ලකුණු 05, 65-69 ලකුණු 10, 70-74 ලකුණු 15, 75-79 ලකුණු 20, 80-84 ලකුණු 25, 85-89 ලකුණු 30, 90-94 ලකුණු 35, 95-99 ලකුණු 40 ) (උදා: වයස අවු: 60 නම් ලකුණු 01 )

2. ක්ෂේත්‍රයේ කලාකරුවකු ලෙස කටයුතු කළ කාලය: ලකුණු 60

   (වසර 10-14 ලකුණු 10, 15-19 ලකුණු 15, 20-24 ලකුණු 20, 25-29 ලකුණු 25, 30-34 ලකුණු 30, 35-39 ලකුණු 35, 40-44 ලකුණු 40, 45-49 ලකුණු 45, 50-54 ලකුණු 50, 55-59 ලකුණු 55, 60ට වැඩි ලකුණු 60) (උදා: වසර 10 නම් ලකුණු 02 ද, වසර 11 නම් ලකුණු 04 ද)

3. 3.1. කලාවේ උන්නතියට කටයුතු කිරීම : උපරිම ලකුණු 25

   (සිදුකර ඇති සේවා සළකා බලා)

   3.2.1. ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරා ගොඩනැගීම: උපරිම ලකුණු 25

   (ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරා තොරතුරු සළකා බලා)

   3.3. දැනටමත් කලාවේ නිරතව සිටීම : උපරිම ලකුණු 25

4. පරම්පරාගත ශිල්පියෙකු වීම/ප්‍රවීන කලා ශිල්පියෙකු වීම : උපරිම ලකුණු 25

5. ලබා ඇති ජයග්‍රහන : ජාත්‍යන්තර/ජාතික/පළාත්/දිස්ත්‍රික්/ප්‍රාදේශීය : මුළු ලකුණු 25

   (ජාත්‍යන්තර: උපරිම ලකුණු 25, ජාතික : උපරිම ලකුණු 20 (ජයග්‍රහන එකකට ලකුණු 05 බැගින්) , පළාත් : උපරිම ලකුණු 15 (ජයග්‍රහන එකකට ලකුණු 03 බැගින්), දිස්ත්‍රික් : උපරිම ලකුණු 10(ජයග්‍රහන එකකට ලකුණු 02 බැගින්), ප්‍රා දේශීය: උපරිම ලකුණු 05 (ජයග්‍රහන එකකට ලකුණු 01 බැගින්)) ( පිළිගත් ජාත්‍යන්තර ජයග්‍රහන එකක් හෝ ලබා ඇත්නම් මුළු ලකුණු 25 ම හිමි වේ).

   *ඉදිරිපත් කරන ලද ජයග්‍රහණ සියල්ල කලා ක්ෂේත්‍රයට අදලා ඒවාද යන්න සැහීමකට පත් විය යුතුය.*

6. ලබාගත් ඇගයීම් හෝ ගරු සම්මාන : මුළු ලකුණු 25

   (ජාත්‍යන්තර: උපරිම ලකුණු 25 *ගරු සම්මාන එකකට ලකුණු 05 බැගින්, ජාතික : උපරිම ලකුණු 20 *ගරු සම්මාන එකකට ලකුණු 04 බැගින්), පළාත් : උපරිම ලකුණු 15 *ගරු සම්මාන එකකට ලකුණු 03 බැගින්, දිස්ත්‍රික් : උපරිම ලකුණු 10, ප්‍රාදේශීය: උපරිම ලකුණු 05 *ගරු සම්මාන එකකට ලකුණු 05 බැගින්)

*ලබා ඇති ඇගයීම් හෝ සම්මාන සියල්ල කලා ක්ෂේත්‍රයට අදාළ ඒවා ද යන්න සෑහීමකට පත් විය යුතුය.*

7. **සිදු කළ හෝ ජනගත කළ නිර්මාණකරණයන් සංඛ්‍යාව :** **මුළු ලකුණු 25**

   **(නිර්මාණ එකකට ලකුණු 05 බැගින් : උපරිම ලකුණු 25)**

8. **සංස්කෘතික බලමණ්ඩල සාමාජිකත්වය :**

   **ලකුණු 05**

   **(ප්‍රධාන නිලයක් දරා ඇත්නම් ලකුණු 05 ම හිමි වේ)**

9. **සමාජ සේවා කටයුතු :** **උපරිම ලකුණු 20**

   **(සිදුකර ඇති සමාජ සේවා කටයුතු, සක්‍රියව දායක වී ඇති ක්‍රියාකාරකම්/ආයතන එකකට ලකුණු 05 බැගින් විනිශ්චය මණ්ඩලයේ තීරණය අනුව)**

*සැ.යු.* **:** *කලාකරු වෙත ගොස් ඔහුගේ තොරතුරු ලබා ගන්නා අවස්ථාවේදී ඉදිරිපත් කරන ලද තොරතුරු ඉහත නිර්ණායකයන් පදනම් කරගෙන සිදු කළ යුතු අතර, ඉදිරිපත් කරන ලද සෑම ලියවිල්ලක් ම කලා ක්ෂේත්‍රයට අදාළ ඒවා බවට සහතික කළ යුතුය. තව ද, ලකුණු ලබාදීමේ ලේඛනය සමඟ තෝරා ගත් කලාකරුවන්ට අදාළව ඇමුණුම 02 යටතේ වූ කලාකරුවගේ තොරතුරු ලබා ගැනීමේ පත්‍රිකාව ද සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු බව සළකන්න.*